සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 31-48
ISSN 1800-1459

# නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි

**ධම්මික හේවගේ**

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර

## සාරසංක්ෂේපය

රත්නපුර දිස්ත්‍රික්කයෙහි පිහිටි ගොන්ගල කඳුවැටියෙන් ආරම්භ වන නිල්වලා ගඟ දිවයිනේ සෙසු ගංගාවලට සාපේක්ෂ ව කුඩා ගංගාවකි. එසේ වුවත් අතීතයේ සිට නිල්වලා ගඟ සමග ගොඩනැගුණු ජීවන ව්‍යවහාරයන් බොහෝමයක් මෙහි දී හඳුනාගත හැකි විය. කෘෂිකර්මාන්තය, ඔරු-පාරු ප්‍රවාහන කටයුතු, ධීවර කර්මාන්තය, වැලි ගොඩදැමීම, ගඩොල් කර්මාන්තය, උණුපහුරු කර්මාන්තය ආදි වෘත්තීය ව්‍යවහාරයන්ට අමතර ව ගංගා රෝහණ පූජාව, නාමල් පූජාව වැනි ආගමික ව්‍යවහාරයන් ද අතීතයේ දී නිල්වලා ගඟ ආශ්‍රිත ව පැවතී ඇත. නිල්වලා ගඟ ආශ්‍රිත මෙම ජීවනව්‍යවහාර ආශ්‍රිත ව ගොඩනැගුණු ජනශ්‍රැති යම් ප්‍රමාණයක් වර්තමානය තෙක් ශේෂ වී තිබේ. මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ වනුයේ නිල්වලා ගඟ දෙපස ජනතාවගේ වහරේ ඇති ජනකවි එක්රැස් කොට ලේඛන ගත කිරීම යි. ගවේෂණාත්මක ස්වරූපයක් ගන්නා මෙම අධ්‍යයනයේ දී මෙතෙක් අප්‍රකට ව පැවති ජනකවි හඳුනා ගත හැකි විය. නිල්වලා ගඟ ආශ්‍රිත ජනශ්‍රැති අතර ප්‍රමාණාත්මක ව වැඩි වශයෙන් හමු වනුයේ ද ජනකවි ය. මෙහි ඇති එක් විශේෂත්වයක් වන්නේ එක ම ජනකවියේ විවිධාකාර ශ්‍රැති ස්වරූපයන් සොයාගත හැකි වීම යි. ඇතැම් ජනකවි අරබයා ඇති වූ ප්‍රවාදයන් ද කලින් කලට විවිධ ස්වරූප ගත් බව අනාවරණය කර ගත හැකි විය. මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් ම භාවිතයට ගනු ලැබුවේ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය යි. ඊට අමතර ව මෙම පර්යේෂණය සඳහා සාහිත්‍ය විමර්ශනාත්මක ආලෝකයක් ග්‍රන්ථ, පුවත්පත් හා වාර ප්‍රකාශන මගින් සපයා ගත හැකි විය. එසේ ම විවිධ ස්ථාන හා සිදුවීම් පිළිබඳ ව නිර්මාණය වූ ජනකවි ද හමු වේ. නිල්වලා ගඟ ආශ්‍රිත ව හමු වන ජනකවිවල ප්‍රස්තුතයන් විමසීමෙන් පෙනී යන්නේ එම බොහෝ ජනකවි මාතර සාහිත්‍ය යුගයේ දී ම නිර්මාණය වූ ඒවා බව යි.

කේන්ද්‍රීය වචනඃ නිල්වලා ගඟ, ජනතාව, ජනශ්‍රැති, ජනකවි, ප්‍රවාද

## හැඳින්වීම

අතීතයේ සිට ම මිනිසා ශිෂ්ටාචාරගත වූයේ ජලය ආශ්‍රිත ව ය. මින් ගංගා නිම්න ප්‍රධාන ස්ථානයක් ගනියි. ජීවත්වීමට අවශ්‍ය ජල පහසුවත් කෘෂි කටයුතු සඳහා හිතකර සාරවත් දියලු පස පිහිටා තිබීමත් හේතුවෙන් ජනතාව ගංගා නිම්න තම ස්ථිර පදිංචි ස්ථාන බවට තෝරා ගත් බව පෙනෙයි. කාලාන්තරයක් තිස්සේ ජනතාව තම දෛනික අවශ්‍යතා සඳහා ජල මූලාශ්‍රය පරිහරණය කිරීමෙන් එම අදාළ ජල මූලාශ්‍රය හා ජනතාව අතර ගොඩනැගෙන චෛන්ද්‍රීය සම්බන්ධය මත උපරි ව්‍යුහයට අදාළ ප්‍රපංචයන් නිර්මාණය විය හැකි ය. උදාහරණයක් ලෙස ගතහොත් ගංගා නිම්නයක ජීවත් වන ජනයා තම ජල අවශ්‍යතා, ආහාර පිණිස මත්ස්‍ය මාංශ අවශ්‍යතා ඉටු කර ගැනීමට නිරතුරු ව භාවිත කරන ගඟ සමග ගොඩනැගෙන සම්බන්ධතාව කරණ කොට ගෙන ඔරු-පාරු කවි වැනි ජනශ්‍රැති නිර්මාණය විය හැකි ය. ඔවුන් එම ගඟෙහි පවත්නා විවිධ වස්තූන් හා ජීවීන් පිළිබඳ ව තේරුම් ගන්නා ආකාරය අනුවත් ගඟ හා සම්බන්ධ විවිධ

ISSN 1800-1459

සිදුවීම් ද පාදක වීමෙන් නිරායාසයෙන් ජනශ්‍රැති නිර්මාණය විය හැකි ය. ජනතාව හා නිල්වලා ගඟ අතර කාලාන්තරයක් තිස්සේ ගොඩනැගී තිබෙන සබඳතාව මත ගඟ හා සම්බන්ධ ජනකවි සාහිත්‍යයක් ගොඩනැගී තිබේ. මෙම අධ්‍යයනයේ මූලික අභිප්‍රාය වනුයේ නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි හඳුනාගැනීම හා සංරක්ෂණය උදෙසා එම ජනකවි සංග්‍රහ කර තැබීම ය. එමගින් ගඟ ආශ්‍රිත ඇතැම් චත්පිළිවෙත් හා වෘත්තිය ව්‍යවහාරයන් ද වෙනත් ජීවන සම්ප්‍රදායයන් පිළිබඳ ව ද ජනකවි මගින් ඇතැම් කරුණු අනාවරණය වීම ද මෙම පර්යේෂණයේ දී සිදු වෙයි.

## සාහිත්‍ය විමර්ශනය

නිල්වලා ගඟ ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් සම්බන්ධ ව බොහෝ ඈත ඉතිහාසයක් තිබේ. නිල්වලා ගඟ හා සම්බන්ධ මුල් ම ලේඛනගත සටහන හමු වන්නේ මහාවංශයෙහි ය.

තතො සො දෙවනගරෙ තථා කම්මාරගාමකෙ
මහාපනාලගාමෙ ච ගාමේ මානකපිටඨියං
නීලවාලනදීතිත්ථෙ කදලිපතතසවහයෙ
ගාමෙ චාති අනෙකෙසු ඨානෙසු ඨීවෙරිහි (මහාවංශය 1959:463)

එහෙත් මහාවංශයෙහි දී නිල්වලා ගඟ පිළිබඳ ව පැහැදිලි විස්තරයක් ඉදිරිපත් නො වේ. පොළොන්නරුවේ රජකළ පළමු වන පරාක්‍රමබාහු රජු එවකට සුගලා දේවිය සතු ව තිබූ දන්ත ධාතුව හා පාත්‍ර ධාතුව ගනු පිණිස රක්ඛ දමිළාධිකාරී හා රක්ඛ කංචුකී යන සෙනෙවිවරුන් දෙදෙනා යටතේ රෝහණයට හමුදාවක් එවී ය (රාය, 1972:446). පරාක්‍රමබාහු රජුගේ හමුදාවත් සුගලා දේවියගේ හමුදාවත් අතර නිල්වලා ගඟේ දී සිදු වූ සටන පිළිබඳ ව මහාවංශයෙහි ඇති සටහන නිල්වලා ගඟ පිළිබඳ පැරණි ම සටහන වෙයි. එසේ ම කෝට්ටේ යුගයේ සිට මාතර යුගය දක්වා රචිත සන්දේශ කාව්‍යවල ද නිල්වලා ගඟ හා සම්බන්ධ වර්ණනා හමු වෙයි. බොහෝ විට ගංගාවෙහි ඇති සුන්දරත්වය මෙහි දී වර්ණනාවට පාත්‍ර වී ඇත.

පුල්වලා කුසුම් මෙන් කොක වැළ නිළස
ලොල් වලා දියැර ගැනුමට බිමට බැස
නිල්වලා රැඳිසෙ සැදී මාරුකු දෙපස
නිල්වලා ගඟිනෙතර යා ගන් සතොස
(තිසර සංදේශය: 34 කවිය)

නිල්වලා ගඟ වඩා ප්‍රකට ව ඇත්තේ කිඹුලන් සඳහා ය. කිඹුලන්ගෙන් මානව ප්‍රජාවට සිදුවන බලපෑම පිළිබඳ ව ඇන්ස්ලම් සිල්වා සිදු කළ අධ්‍යයනයේ දී කිසිවිටකත් ඔහු නිල්වලා ගඟ ආශ්‍රිත ව නිර්මාණය වී ඇති සංස්කෘතිකාංග කෙරෙහි අවධානය යොමු කොට නැත (De silva, 2008).

'මාතර ගඟේ ඉන්නා කිඹුලිගෙ පැටියා' යන නිල්වලා ගඟ ආශ්‍රිත සුප්‍රකට ම ජනකවිය පිළිබඳ ව විවිධ අර්ථකථන දක්වමින් හා එම ජනකවිය සඳහා පාදක වූ විවිධ සිදුවීම් පිළිබඳ ව දක්වමින් පුවත්පත්වල කෙටි ලිපි පළ වී ඇතත් නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි සම්බන්ධ ව විස්තරාත්මක පර්යේෂණ පත්‍රිකාවක් හෝ කෘතියක් සම්පාදනය වී නොමැති බැව් පෙනෙයි. ජයතිස්ස තෙන්නකෝන් විසින් රචිත 'නිල්වලා ජනකතා' කෘතියෙහි දී නිල්වලා නිම්නයේ ප්‍රචලිත ජනශ්‍රැති පිළිබඳ හඳුනාගැනීමට ගෙන ඇති උත්සාහයේ දී නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි කිහිපයක් පිළිබඳ ව සැකෙවින් විස්තර ඉදිරිපත් කොට තිබේ (තෙන්නකෝන්: 2006). එමෙන් ම වරින් වර පළ වූ ජනකවි සංග්‍රහයන්වල ද නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි සුළු වශයෙන් පළ වී ඇතත් අප්‍රකට ව පැවති බොහෝ ජනකවි ප්‍රමාණයක් මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය.

## පර්යේෂණ ගැටලුව

රත්නපුර දිස්ත්‍රික්කයේ ගොන්ගල කඳුවැටියෙන් ආරම්භ වන නිල්වලා ගඟ කිලෝ මීටර් හැත්තෑ දෙකක් දුර ගෙවා මාතර තොටමුණ ප්‍රදේශයෙන් මුහුදට වැටෙයි. අනාදිමත් කාලයක සිට ගඟ හා සම්බන්ධ විවිධ ජීවන ව්‍යවහාර ගොඩනැගී තිබුණි. කෘෂි කටයුතු සඳහා ද දෛනික ජීවිතය සඳහා ද ගඟේ ජලය භාවිත විය. වැලිගොඩදැමීම, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය, ඔරු-පාරු ප්‍රවාහනය යනාදී නොයෙක් ජීවන ව්‍යවහාර සඳහා ද ගංගාරෝහණ පූජාව, නාමල් පූජාව වැනි ආගමික ව්‍යවහාර සඳහා ද නිල්වලා ගඟ අතීතයේ දී භාවිතයට ගනු ලැබූව ද වර්තමානය වන විට අධික ව සිදුවන කිඹුල් ප්‍රහාර හේතුවෙන් ජනතාව නිල්වලා ගඟ හා පැවැත් වූ බොහෝ සබඳතා අත්හිටුවා තිබේ. නිල්වලා ගඟේ පහළ ජලාධාරය ආශ්‍රිත ජනතාව කෘෂි කටයුතු හැරුණු විට නිල්වලා ගඟෙන් කිසිදු ප්‍රයෝජනයක් නොගන්නා තත්වයට පත් ව තිබේ. මෙවැනි තත්වයක් යටතේ නිල්වලා ගඟ ආශ්‍රිත ව ජනකවි බිහි වී තිබේ ද? අතීතයේ දී ජනකවි නිර්මාණය වූයේ නම් එම ජනකවි වර්තමානය වන විට ශේෂ ව පවතින්නේ ද? ඒ මොනවා ද? යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වෙයි.

## පර්යේෂණ අරමුණු

නිල්වලා ගඟ ආශ්‍රිත ව ගොඩනැගී ඇති ජීවනව්‍යවහාර හා සබැඳි ජනකවි හඳුනාගැනීම සහ ඒවා එක්රැස් කොට සංග්‍රහ කිරීමත් එමගින් නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි සංරක්ෂණය උදෙසා ප්‍රවේශයක් නිර්මාණය කිරීමත් මෙම ගවේෂණාත්මක පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වෙයි

## පර්යේෂණයේ වැදගත්කම

නිල්වලා ගඟ ආශ්‍රිත ව සීමිත අධ්‍යයන ප්‍රමාණයක් සිදු ව ඇතත් ඒ සියල්ල ම නිල්වලා ගඟ ආශ්‍රිත භෞතික තත්ත්වයන් කෙරෙහි මූලික අවධානය යොමු කළ අධ්‍යයනයෝ වෙති. නිල්වලා ගඟ ආශ්‍රිත ව ගොඩනැගී ඇති අභෞතික සංස්කෘතියෙහි අංගයක් වන ජනකවි සම්බන්ධ ව මේ තාක් විධිමත් අධ්‍යයනයක් සිදු ව ඇති බව විද්‍යමාන නො වේ. මෙම අධ්‍යයනයේ දී එකී අඩුව යම්තාක් දුරට හෝ පිරවීමේ ප්‍රයත්නයක නිරතවෙමින් නිල්වලා ගඟ ආශ්‍රිත ව පවත්නා

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 31-48
ISSN 1800-1459

මුඛ පරම්පරාගත ජනකවි ඒකරාශි කොට සංග්‍රහ කර දක්වයි. එසේ ම එම ජනකවිවල සුවිශේෂී අනන්‍යතා ලක්ෂණ හඳුනාගන්නා හෙයින් නිල්වලා ගඟ ආශ්‍රිත ව පැවති මානව සංස්කෘතික සම්බන්ධතා අධ්‍යයනය කරන පසු කාලීන විද්‍යාර්ථීන්ට මෙම ගවේෂණාත්මක පර්යේෂණය වැදගත් වෙතැයි අපේක්ෂා කළ හැකි ය. එසේ ම ජනකවි එක්රැස් කොට සංග්‍රහ කිරීම මගින් නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි සංරක්ෂණය වීම ද මෙම පර්යේෂණයේ එක් වැදගත්කමක් ලෙස දැක්විය හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ.

1. දත්ත රැස්කිරීම
2. දත්ත ඉදිරිපත් කිරීම

### 1. දත්ත රැස්කිරීම

#### (අ). ප්‍රාථමික දත්ත රැස්කිරීම

ප්‍රාථමික දත්ත ලෙස ගුණාත්මක තොරතුරු ලබාගැනීමේ ප්‍රධාන ම මූලාශ්‍රයයක් ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිත කරන ලදී. තෝරාගත් පුද්ගලයන්ගෙන් හා පුද්ගල කණ්ඩායම්වලින් තොරතුරු ලබා ගැනීමේ දී මෙම ක්‍රමවේදය භාවිත කළ අතර මෙහි දී සම්මුඛ සාකච්ඡාවල උප ප්‍රභේද වන අව්ධිමත් සම්මුඛ සාකච්ඡා, විවෘත සම්මුඛ සාකච්ඡා මගින් වැඩි තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගන්නා ලදී.

#### (ආ). ද්විතීයික දත්ත රැස්කිරීම

ද්විතීයික දත්ත රැස්කිරීමේ දී ග්‍රන්ථ, පුවත්පත්, වාර සඟරා සහ නො පළ වූ ලිඛිත සටහන් භාවිතයට ගැනිණි.

### 2. දත්ත ඉදිරිපත් කිරීම

දත්ත ඉදිරිපත් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ම සටහන් භාවිතයට ගන්නා ලදී. යම් ශ්‍රැතියක ප්‍රකෘති ස්වභාවය අවබෝධ කර ගැනීමට නම් එය ජනව්‍යවහාරයේ පවතින ආකාරයෙන් ම ඇසිය යුතු ය. එහෙයින් ජනශ්‍රැති වටිනාකමකින් යුත් සෑම අදහසක් ම ජනතාවගෙන් අසා පටිගතකරගත් පරිදි ප්‍රකෘති භාෂණයෙන් ම ඉදිරිපත් කිරීමට කතුවරයා උත්සාහ ගනියි.

## සාකච්ඡාව

සිංහල ජනකවියෙහි ඉතිහාසය බොහෝ ඈත අතීතයට දිව යන්නෙකි. සියබස්ලකර ලිවීමට ප්‍රථම ස්වාධීන සිංහල කාව්‍ය සම්ප්‍රදායයක් තිබූ බවට සීගිරි ගීවලින් සාධක සපයා ගත හැකි ය. සීගිරි ගී අතර ද ජනකවි සම්ප්‍රදායට අනුගත ව ලියවුණු කාව්‍ය නිර්මාණ හමුවේ. එහෙත් එම ගී කැටපත් පවුරෙහි

සටහන් ව තැබූ හෙයින් ප්‍රබන්ධයේ භාෂාව විපරිණාමයට හසු නො වී ය. එහෙයින් සීගිරි ගීයේ භාෂාව වර්තමාන සාමාන්‍ය ජනයාට දුර්වබෝධ ය. එහෙත් ජනකවි බොහෝ කාලයක් යනතුරු කුමන ආකාරයකින් වත් ලේඛන මාධ්‍යයෙන් සටහන් නො වූ හෙයින් නිරන්තරයෙන් විපරිණාමය වන සමාජ සංස්කෘතික ප්‍රවාහය සමඟ වර්තමානය දක්වා පැමිණ තිබේ. එහෙයින් ජනකවියෙහි බස සාමාන්‍ය ජනවහරින් වෙනස් නො වේ. ජනකවි, විදග්ධ කාව්‍ය මෙන් පිළිගත් සම්ප්‍රදායකට නතු ව නිර්මාණය නො වූ අතර ඒ ඒ අවස්ථාවෝචිත ව තම සුඛ ප්‍රහර්ෂයන් හා දුක්ඛ දෝමනස්සයන් ප්‍රකාශනයෙහි ලා යොදා ගෙන ඇති බව පෙනේ. මෙහි දී කවියාට හුරු පුරුදු පරිසරයෙන් ම ප්‍රස්තුතයන් හා උපමා යොදා ගත් අතර භාරතීය ආලංකාරිකයන්ගේ මඟ අනුදත් සාම්ප්‍රදායික (විදග්ධ) කවීන් මෙන් තම කාව්‍ය සඳහා බැහැරින් රැගත් උපමා රූපක ආදී අලංකාරෝක්ති යොදා ගත්තේ නැත. ජනකවියා සම්මත භාෂාමය බැඳීම්වලින් තොර ව එදිනෙදා ව්‍යවහාර වූ සරල භාෂණයෙන් ම කවි කීවේ ය. වර්තමානය වන විට ශේෂ වී ඇති ජනකවිවල ප්‍රස්තුතයන් දෙස බැලීමෙන් පෙනී යන්නේ ඒවා බොහෝමයක් නුවර-මාතර යුගයේ දී නිර්මාණය වූ ඒවා බව යි. අධ්‍යාපනය දියුණු වීමත් සමඟ වර්ධනය වූ කාව්‍ය ප්‍රබන්ධකරණය බහුජනප්‍රිය මාධ්‍යයක් බවට පත්වූයේ මාතර යුගයේ දී ය. ඒ අවසරයෙන් මේ තාක් අනුරාධපුර සමයේ සිට අඛණ්ඩ ව පැවත ආ කාව්‍යයේ චූල සම්ප්‍රදාය ඉස්මතු වීම සිදුවිය.

දීර්ඝ කාලයක් තිස්සේ මුඛ පරම්පරාගත ව පැවත එන ජනකවි කේවල නිර්මාණ වශයෙන් හැඳින්විය නො හැකි ය. එහෙත් උගත් ගැමියන් විසින් ලියා පසු ව ශ්‍රැති මාධ්‍යයෙන් පැවත එන්නා වූ ජනකවි මුඛ පරම්පරාවෙන් ම පැවතෙන්නා වූ ජනකවිවලට වඩා ලාක්ෂණික වශයෙන් පරස්පරතා පෙන්වයි.

ගොන්ගල කන්දේ කුඩා දිය පහරකින් ආරම්භ වන නිල්වලා ගඟ මඟ දී එකතුවන කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අතුගංගාවන්ගෙන් පෝෂණය වෙයි. නිල්වලා ගඟට වැටෙන ප්‍රධාන අතු ගංගා ලෙස මිල්ල ඇළ, අතු ඇළ, සියඹලාගොඩ ගඟ, හුලංදා ඇළ, දිගිලි ඇළ, (දිගිලිය), කිරම ආර යනාදිය හැඳින්විය හැකි ය.

නිල්වලා ගඟ ආශ්‍රිත ජනශ්‍රැති අතර ප්‍රමාණාත්මක ව වැඩි වශයෙන් හමුවනුයේ ජනකවි ය. ගංගා පරිවහනය හේතුවෙන් බොහෝමයක් ඔරු පාරු කවි බිහි වී තිබේ. එසේ ම විවිධ ස්ථාන හා සිදුවීම් පිළිබඳ ව නිර්මාණය වූ ජනකවි ද මේ අතර වේ.

නිල්වලා ගඟට පරසිදු ඒ දණ්ඩ
මුලවෙලා කෙරෙව් මහතුන් බුදු වණ්ඩ
ලොල් වඩවන ගං කඳු දෙක සරි ලණ්ඩ
ඇත් ද කොදෙව්වට කද්දූව ඒ දණ්ඩ

(කණ්ඩම්බි, 2008.03.22)

නිල්වලා ගඟ හරහා පිහිටුවා තිබූ ප්‍රසිද්ධ ඒදඬු අතර නාවිමන ඒදණ්ඩ, වැල්ලෙතොට ඒදණ්ඩ හැඳින්විය හැකි වුවත් සුප්‍රසිද්ධ ම ඒදණ්ඩ වූයේ කද්දූව ඒදණ්ඩ යැයි කිව හැකි ය. දෙනියාය, මොරවක, පිටබැද්දර, සියඹලාගොඩ, දෙහිගස්පෙ, බෝපගොඩ, අකුරැස්ස, මලිදූව යනාදී ප්‍රදේශවල සිට මාතරට

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013. සත්වැනි කලාපය. පිටු 31-48
ISSN 1800-1459

ගමනාගමනය සඳහා තිබූ ප්‍රධාන ගැල් මාර්ගය වැටී තිබුණේ ගං කන්ද දිගේ ය. මගින් ඊදණ්ඩෙන් එගොඩ මෙගොඩ වූ අතර ගැල්කරුවෝ නො ගැඹුරු ගඟ හරහා ගැල් එගොඩ මෙගොඩ කළෝ ය. තිල්වලා ගඟේ ඉහළ සිට මාලිම්බඩ දක්වා බොහෝ ස්ථානයන්හි පා ගමනින් ගඟ එගොඩ මෙගොඩ විය හැකි තරමට නො ගැඹුරු ව පැවතී ඇතත් අධික ලෙස වැලි ගොඩ දැමීම නිසා වර්තමානය වන විට ගඟ බොහෝ සේ ගැඹුරු වී තිබේ.

කද්දූව ප්‍රසිද්ධ උළු අම්බලම පිහිටියේ ද මෙම ඒ දණ්ඩ අසල ය.

කද්දූව එගොඩ උළු අම්බලම ගාවා
ගෑනු තුන් දෙනෙක් හිස නාව නාවා
අපි දැකලා උන් කරවන නුරාවා
කොහොමද ලියෝ සිත සනසන උපමාවා

(කොඩිතුවක්කු, 2008.01.21)

මෙම ජනකවිය අන්දරේගේ ප්‍රබන්ධයක් බව ඇතමෙක් පවසතත් (තෙන්නකෝන් 2006: 59) ඒ සඳහා කිසිදු ජනශ්‍රැතිමය සාක්ෂ්‍යයක් හමු නො වේ. එසේ ම මෙම ජනකවිය විවිධ වෙනස්කම් සහිත ව ස්වරූප කිහිපයකින් හමු වේ.

කද්දූව ගඟේ උළු අම්බලම ගාවා
ගෑනු සිව් දෙනෙක් හිස නාව නාවා
මම දැකලා උන් කරනා නුරාවා
කොහොමද ලියෝ සිතු නලවන උපාවා

(පතිරණ, 1987:192)

කද්දූව ඒ දණ්ඩ උළු අම්බලම ගාවා
ගෑනු තුන් දෙනෙක් ඉස නාව නාවා
දිය බුං ගසා උන් කරවන නුරාවා
කොහොමද ලඳේ සිතු නළවන උපාවා

(තෙන්නකෝන්, 2006:59)

කද්දූව ගොඩ උඩ උළු අම්බලම ගාවා
ගෑනුන් තිදෙනෙක් හිස නාව නාවා
මා දැක උන් මේ කරන සිනාවා
කොහොමද යන්නෙ උන් සිත නො නළවා

(ගමගේ, 2008.02.25)

කද්දූව එගොඩ උළු අම්බලම ගාවා
ගෑනුන් හත්දෙනෙක් හිස නාව නාවා
අප දැකලා උන් කරනා විනාවා
කොයිබඳ ලඳේ හිස පීරන පනාවා

(ලීලාරාම, 2008.02.23)

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 31-48
ISSN 1800-1459

මෙම ජනකවියේ විවිධ ශ්‍රැති ස්වරූප ජනශ්‍රැතියෙහි ස්වභාවය මැනවින් විශද කරයි. පරම්පරා කිහිපයක් ඔස්සේ ශ්‍රැති මාත්‍රයෙන් එන ඕනෑ ම දෙයක් ඒ ඒ පුද්ගලයන්ගේ ස්මරණ ධාරිතාව හා පරිකල්පනය මත විවිධ ස්වරූපයෙන් ඉදිරිපත් වීම සාමාන්‍ය ස්වභාවය යි.

කතරගමයි දේවාලය දෙවියන්ගේ
අතරමඟයි අද අපි දිය නෑවෙ ගඟේ
සතර දෙනයි ගෑවෙත් රත් සඳුන් ඇඟේ
වතුර සොඳයි **තවමත්** නිල්වලා ගඟේ

(ප්‍රඥාලෝක, 1952:320)

මෙම ජනකවියේ "තවමත්" යන්න වෙනුවට "කවදත්" යනුවෙන් යෙදී ඇති ස්ථාන ද හමුවේ (වීරසූරිය, 1993: 89). මාතොට වාණිජ වශයෙන් පමණක් නො ව ආගමික වශයෙන් ද වැදගත් වූ බව මෙම ජනකවියෙන් පෙනේ. පා ගමනින් හෝ ගැල්වලින් දෙවුන්දරට, කතරගමට වන්දනාවේ යන එන ජනතාවට ජලස්නානය කොට පිරිසිදු වීමට හා වෙහෙස නිවා ගැනීමට නිල්වලා ගඟේ ප්‍රධාන තොටුපළ ඉතාමත් ප්‍රයෝජනවත් වූ බව උක්ත ජනකවියෙන් පැහැදිලි වේ.

**නිල්වලා ගඟේ** බැසලා නාන කොට
සුරඟන වැනි ලියක් විත් බැස්සා නෑමට
කරේ තිබුණු මුතු දෙපොටේ ලස්සනට
අරන් යන්න හිතුනයි අඟුලෙන් ගමට

(ප්‍රඥාලෝක, 1952:323)

මෙම ජනකවියෙහි ''නිල්වලා ගඟේ ''යන යෙදුම වෙනුවට "කරුවල තොටේ", "මහවැලි ගඟේ" යනා දී වශයෙන් විවිධ ප්‍රදේශවල දී භාවිත වන බව පෙනෙයි.

මෙම ජනකවිය ම නිල්වලා ගඟබඩ කද්දූව ප්‍රදේශයේ දී වෙනස් ස්වරූපයකින් හමු වේ.

**කද්දූව තොටේ** මම බැසලා නාන කොට
සුරඟන ලියක් ආවයි මගෙ පෙර මඟට
කරේ තිබුණු මුතු **දෙපටේ** ලස්සනට
අරන් යන්න හිතුනයි අඟුලෙන් ගමට

(ලීලාරාම, 2008.02.23)

ඉහත ජනකවි දෙකට ම පිළිතුරක් වශයෙන් කියන ලදැයි සිතිය හැකි ජනකවියක් ද වෙයි.

අපේ තොටේ අපි බැසලා නාන වට
අතේ කරේ මුතු බැඳලා තියන වට
මය නයිදේ ගඟ බැසලා නැවාට
අපි කුමකට යමුද කට මැත දොඩන්නට

(ප්‍රඥාලෝක, 1952:323)

එක් ජනකවියකට පිළිතුරක් වශයෙන් තවත් කවියක් ආදී ලෙස එන යුගල ජනකවි සිංහල ජනශ්‍රැතියෙහි විරල නො වේ. "අපේ තොට" යනුවෙන් මෙහි සඳහන් වන්නේ පොදු නාන තොටුපළක් නො වේ. එක් පවුලක් නො එසේ නම් පවුල් කිහිපයක් හෝ එක් කුලයකට අයත් පිරිසක් හෝ පමණක් භාවිත කරන තොටුපළවල් වර්තමානයේ වුව ගම්බද ප්‍රදේශවල දැකිය හැකි ය.

බිලී බාන්නට ගස යට සෙවනැල්ල
ගිලී නාන්නට ගඟ මැද දියරැල්ල
දිලී තිබෙනවා දැක එහි සුදු වැල්ල
ගුඟටත් කුල කියති හුන්නන්නේ ඇල්ල

(හරමානිස්, 2008. 02. 12)

අතුරලිය බටහිරට අයත් "හුන්නන්නේ ඇල්ල" නම් තොටුපළ අතීතයේ දී එක් කුලයකට පමණක් සීමා වූ තොටුපළකි. 'හුන්නන් ', 'හුන්නෝ ', 'හුනු මිනිස්සු ', 'හුනු කුලේ අය', යනුවෙන් අතුරලිය ප්‍රදේශයේ දී හඳුන්වනුයේ සාම්ප්‍රදායික පෙදරේරු කාර්මිකයෝ ය. අතුරලිය ප්‍රදේශයේ පිහිටා ඇති 'හුන්නන්නේ ඇල්ල' නම් තොටුපළ අතීතයේ දී එම කුලයේ සාමාජිකයන් සඳහා ම වෙන් වූ තොටුපළකි. මෙම කවිය උගත් ගැමි කවියකු විසින් නිර්මාණය කොට පසු ව ශ්‍රැති ව්‍යවහරට එක් වූවක් බව සිතිය හැකි ය.

ආර්. කේ. ෆ්‍රැන්සිස්ගේ (වෙද රාළහාමි) (උපත: 1907-විපත: 1994, ලිපිනය: පරදූව, අකුරැස්ස.) අත් ලිපියක මෙම කවිය සඳහන් වන්නේ මෙසේ ය

පිළී තිබ්බන්නත් ගස මුල සෙවනැල්ල
ගිලී නාන්වත් ගඟ මැද දිය රැල්ල
යුන එන්නන් දැක පිපුනේ සුදු වැල්ල
ගඟටත් කුල කියති හුන්නන්නේ ඇල්ල

"ඒ කාලෙ පල්ලිමුල්ල තොට කොච්චර කවි කියපු තැනක් ද. මේ තොටට පඹුරණ පොල්හේනෙ කට්ටිය නාන්න යනව. පයින් ම තමයි යන්නෙ. දවසක් රිජිස්ටර් රාළහාමියි, කෝර්නේල් රාළහාමියි තවත් අය මේ තොටට නාන්න ගියා. ගඟේ නාන්න හොඳට පුරුදු ගෑනු අයත් මෙතන නානව. නාන ගෑනු කෙනෙක් දැකල එක්කෙනෙක් කවි පදයක් කිව්ව මෙහෙම.' සිහින් වෙන්න ගිගදිය බොන ලකල්ලේ 'තව එක්කෙනෙක් දෙවැනි පදේ කිව්ව මෙහෙම. 'නවංදන්න කත අර පල්ලියමුල්ලේ' තුන්වැනි පදේ තව කෙනෙක් කිව්ව. 'හොඳිං දන්න රතී මායං කෙළිලොල්ලේ' කවුරුත් මෙහෙම කිව්වම රිජිස්ටර් රාළහාමි

හතරවෙනි පදේ මෙහෙම කිව්ව. 'තියං ඉන්න හිතුනා මට තුරුල්ලේ' මේක වාදයක් වගේනෙ. කවි තරගෙන් පරදින්න අකමැතිකමට රිජිස්ටර් රාළහාමි කිව් හතරවෙනි පදේට කාටත් හිනා.

සිහින් වෙන්න ගඟදිය බොන ළකල්ලේ
නවංදන්න කත අර පල්ලියමුල්ලේ
හොඳිං දන්න රති මායං කෙළ ලොල්ලේ
තියං ඉන්න හිතුනා මට තුරුල්ලේ

එළිසමයත් ගළපල මේ කවියෙ පද හතර කිව්වෙ හතර දෙනෙක් '' (රිචඩ් ද සිල්වා, 2008.12.21).

නිල්වලා ගඟ "ගංවතුර" සඳහා බොහෝ ප්‍රසිද්ධ වූ ගංගාවකි. වැසි සමයේ දී ගඟේ පහළ ජලාධාර ප්‍රදේශ ගංවතුරෙන් යටවීම සුලබ සිදුවීමකි. ගංවතුරෙන් සේ ම ගඟේ ගමන් ගත් ඔරු පාරු පෙරළීමෙන් ද ජනතාවට වූ ව්‍යසන පිළිබඳ ව නිර්මාණය වූ ජනකවි දක්නට ලැබේ.

ගලලා වතුර එන කලට මඩවෙලා
සොයලා එකත එන එනව දැක පාවෙලා
පැදලා ඔරුව කනපිටට පෙරලිලා
තෙමිලා සිටිමි දන සේදී දුක්වෙලා
(සෙනෙවිරත්න, 1964:200)

කල් බලා වසින වැසි ගොන් ගල් කන්දේ
යයි ගලා දෙගම්බඩ ඕවිටි බින්දේ
නිල්වලා දියේ ගොස් මාතර රැන්දේ
නිල්වලා ගඟට දිවි පිදූවද නැන්දේ
(බැද්දේගම, 2002:53)

දීර්ඝ කාලයක සිට ම නිල්වලා ගඟ දෙපස පදිංචි ජනතාවගේ විශ්වාසයක් වූයේ සෑම වසරක ම මැයි මස විසිපස් වන දින නිල්වලා ගඟ දෙගොඩ තලා ගලන බව යි. දිනය කෙසේ වුව ද වර්තමානයේ දී ද නිල්වලා ගඟ දෙපස අනාරක්ෂිත ප්‍රදේශවල වාසය කරන ජනතාව ගංවතුර උපද්‍රවයට මුහුණ දෙති. නිල්වලා යෝජනා ක්‍රමයෙන් ඉදිකළ වේලි නිසා මෙම අනාරක්ෂිත ප්‍රදේශ නිර්මාණය විය. ගංගාවත් වේල්ලත් අතර පිහිටා ඇති සියලු ම ගම්මාන මේ අනුව අනාරක්ෂිත කලාප ලෙස වෙන් කොට තිබේ. ගංවතුරක දී විශාල ම හානිය සිදුවනුයේ මෙම අනාරක්ෂිත ප්‍රදේශවල වාසය කරන ජනතාවට ය. මැයි මස විසිපස් වන දිනය වන විට සරණාගත කඳවුරුවලට යාමට "බඩු මුට්ටු" සූදානම් කරන ජනතාව වර්තමානයේ දී ද දැකිය හැකි ය. සතියක් හෝ දෙකක් මේ ජනයා මාතර මහා විද්‍යාලය, ගබඩවීදිය කණිටු විදුහල සහ කිතුලෙවෙල පිරිවෙණ ආදී ස්ථානවල ලැගුම් ගනිති (විජයසෝම, 2008.02.12). ගමනාගමනය දුෂ්කර වූ අතීතයේ දී මනාළියන් කැන්දාගෙන ඒම සඳහා ද ඔරු, පාරු, අඟුල් ආදී ජලයාත්‍රා උපයෝගී කොටගෙන තිබේ (කොඩිතුවක්කු, 2008.01.21). "දැවැද්දත්" පටවා ගෙන

*ISSN 1800-1459*

මනමාලියක් කැන්දාගෙන ඔරුවේ නැගී එද්දී සිදු වූ අනුවේදනීය සිදුවීමක් ජනකවියට නැගී ඇත්තේ මෙසේ යː

මස්සිනාගේ මඟුලට මම රුහුණු ගියා

පස්ස බලන කොට ඔරුවත් ගිලී ගියා

නැවක් බරට බඩු පටවන් එන්න ගියා

රත්තරන් නෑනා මාතර ගඟේ ගියා

1955 වර්ෂයෙහි දෙසැම්බර් ශ්‍රී ලංකා සඟරාවේ පළ වී ඇති මෙම ජනකවියෙහි දෙවන තුන්වන කාව්‍ය පාද මාරු වී ඇතැයි සිතිය හැකි ය.

මෙම ජනකවිය ම පද කිහිපයක වෙනස්කමින් යුක්තව ද හමුවේ.

මස්සිනාගේ මඟුලට මම සමාදියේ

ලස්ස ගණන දී අඟුලේ නැගිගියේ

පස්ස බලන කොට අඟුලත් ගිලිගියේ

රත්තරන් ලියකි තෙලිකඩ ගඟේ ගියේ

මස්සිනාගේ මඟුලට මම රූණ ගියා

ලස්ස ගණන් බඩු පටවන් එන්න ගියා

පස්ස බලන කොට අඟුලත් ගිලී ගියා

රත්තරන් නෝන බෙන්තර ගඟේ ගියා

(පතිරණ, 1990:64)

නිල්වලා ගඟ දිගේ ඔරු පාරුවලින් වටගෙදර පන්සලට නාමල් පූජා කරන්නට වන්දනාවේ ගිය වන්දනාකරුවන් අතර ප්‍රසිද්ධ වූ ජනකවියක් මෙසේ යː

මලේ මලේ ඔය නාමල නෙළා වරෙන්

අත්ත බිදෙයි පය බූරුලෙන් තබා වරෙන්

නාදුගලෙන් ඔරු යනවා බලා වරෙන්

සාදු කාර දී ඔරුවක නැගී වරෙන්

(රේවත හිමි, 2008.02.27)

මෙම ජනකවිය ම පාද කිහිපයක් වෙනස් ව මෙසේ ද හමුවේ.

ඔන්න මලේ ඔය නාමල නෙළා වරෙන්

අත්ත බිදෙයි පය බූරුලෙන් තබා වරෙන්

නාදුගලින් එන ඔරුවක් සොයා වරෙන්

සාදු කාර දී ඔරුවට නැගී වරෙන්

(ගමගෙ, 2008.02.25)

උක්ත ජනකවි දෙක හා බොහෝ සෙයින් ම සමාන ජන කවියක් කැළණි ගඟ ආශ්‍රිත ව ද හමුවේ. මෙයින් කුමන ජනකවියක් කලින් බිහි වූයේ ද යන්න නිගමනය කිරීම දුෂ්කර ය. එහෙත් දිවයිනෙහි බහුප්‍රචලිත ව ඇත්තේ කැළණි ගඟ ආශ්‍රිත ජනකවිය යි. එය මෙසේ යඃ

ඔන්න මලේ ඔය නා මල නෙළා වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැළණි ගඟේ ඔරු යනවා බලා වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී වරෙන්

(අන්දිරිස්, 2008.02.05)

කාවල් කරන කිඹුලන් සිටියත් දෙතරේ
නාඹුල් බඳට සිත් බැඳුනේ යනෙන වරේ
නා දල්ලක් වගේ තොල් පොපියන නිතරේ
නාමල් නෙලන්නට එනවද ගං ඉවුරේ

(බැද්දේගම, 2002:54)

වටගෙදර පන්සලේ නාමල් පූජාවට ගිය තරුණ තරුණියන්ගේ භක්තිය හා ශ්‍රද්ධාව පරයා මතු වූ ප්‍රේමණීය හා ශෘංගාරාත්මක හැඟීම් යථෝක්ත ජනකවියෙහි ගැබ් වී තිබේ.

මාතර ගඟේ ඔරු පැද පැද යනා විට
දෙවඟන වැනි ලියක් චිත් බැස්සා නැමට
ඇගේ වත තඹර යැයි බඹරුන් මුලාවට
පත්වනු දුටු මෙමට මුව මදි සිනාවට

(රත්නායක, 1981:181)

මෙම කවියෙහි යෙදී ඇති උපමා රූපක අනුව මෙය සාමාන්‍ය නූගත් ගැමි කවියෙකු අතින් නිරායාසයෙන් බිහි වූවක් නො ව උගත් ගැමියෙකු විසින් නිර්මාණය කර පසු ව ජනශ්‍රැතියට එක් වූවක් බව සිතිය හැකි ය. ජනකවියට උරුම නෛසර්ගික ගලායාම මෙහි අවරෝධනය වී තිබේ. විශේෂයෙන් ම රූපක භාවිතය ජනකවියෙහි අතිශය විරල ය.

මාතර ගඟේ ඔරු යන්නේ පැද්ද විටයි
කෙකටිය මලේ වක යන්නේ වතුරකටයි
බෝඹු ඉපල දළු ලන්නේ වැස්සකටයි
සඳවත දිලෙන්නේ හිච්චක් ඇඬූ විටයි

(කාරියවසම්, 1975:07)

මෙම ජනකවිය ස්ත්‍රී පුරුෂ සම්භෝගය ව්‍යංග්‍යාර්ථවත් කරමින් ඉතා සූක්ෂ්ම ව හා සංයමයෙන් යුක්ත ව ශෘංගාර රසය උද්වහනය කරයි.

තිල්වලා ගඟේ ගඟ අසබඩ ගලේයා
බාලොලී තලේ දක මගෙ සිත සැලේයා
නාඹර ඇගේ ඉසි ගෝමර දිලේයා
පාරුව පදින්නට බැරි සිත දුලේයා

(බැද්දේගම, 2002:54)

යට දක් වූ ජනකවියේ සේ ම මෙහි ද මුඛ්‍ය රසය වී ඇත්තේ ශෘංගාරය යි.

වතුර හා උනා වරලස පිට දිගට
හැතිරී මා දෙසේ බලමින් හොර කමට
වපුරනා ලෙසට පය පැටලුනයි මට
මිතුරෙ මම එදා බේරුනේ පෙර පිනට

(සෙනෙවිරත්න, 1964:200)

මහ මග හෝ ඒදණ්ඩක හෝ ගමන් කරමින් සිටි පුද්ගලයකු, වතුර හා වරලස මුදා හැර යමින් සිටි ස්ත්‍රියක් දෙස බැලීමට ගොස් පය පැකිලී වැටීමට ගිය ආකාරය ජනකවියා සිය මිතුරෙකුට පැවසුවේ ස්ත්‍රිය පිළිබඳ ව තම නො මනාපය ද පළකරමිනි.

පාරු තැල්ල හරියට බුදු පියා වගේ
අවල් හතර එක පවුලේ දරුවෝ වගේ
උයන කොලුව හරියට මහසෝන වගේ
සිව්පද කියන්නට මම අන්දරේ වගේ

(වල්පොල, 2008.01.21)

තිල්වලා ගඟේ ඔරු පාරු පැදීමෙන් ජීවිකාව ගෙන ගිය අතීත ඔරු පාරුකරුවන් තම ජීවිකාව සරිකරගත් පාරුව කෙරෙහි දක් වූ භක්තිමත් බව උක්ත ජනකවියෙන් විශද වේ.

රෙදි සේදීම වෘත්තීය කොටගත් පිරිසක් ද තිල්වලා ගඟ ආශ්‍රිත ව විසූහ. රෙදි සේදීම සඳහා භාවිත කළ තොටුපළවල් ස්නානය සඳහා භාවිත නො කරන ලදී. තිල්වලා ගඟේ පහළ සිට ඉහළට ම "රදාතොටුපළ" නමින් හඳුන්වන මෙවැනි තොටුපළවල් වර්තමානයේ දී වුව දැකිය හැකි ය. එහෙත් අතීතයේ දී මෙන් වෘත්තීය වශයෙන් රෙදි සේදීම මෙකල විරල ය.

ඊශ්වරගෙයි ලොකු අප්පුහාමි, ඊශ්වර ලොකු මහත්තයා, ඊශ්වර මුත්තා යන නම්වලින් ප්‍රසිද්ධ ව සිටි කවියෙක් මාතර යුගයේ සිටියේ ය. තොටුපළක රෙදි සෝදමින් සිටි රෙදි නැන්දා කෙනෙකු දුටු ඊශ්වර කවියා රෙදි නැන්දාට ඇසෙන්නට කවියක් කීවේලු. එය මෙසේය:

පොල්පිති පුලුස්සා අලු අරගෙන දෙසද්සදා
කහට පොතු කපා ගිනි මොළවා දෙසද්සදා
අපුල්ලන තොටේ කනිවට මම ඉසද්සදා
දිග තොයන් රෙදි නැන්දේ වදිසද්සදා

මෙම කවිය ඇසූ රෙදි නැන්දා ඊට වහා ම පිළිතුරු කවියක් කීවේලු.

රිදී නම් රිදී දසයන          රිදීමා
රිදී ගන්ට තමුසෙට හිතුනා          හේමා
රිදී ගන්ට ආවොත් තමුසේ          හේමා
දිදී පිටට එළවයි හේනේ          මාමා

(දිශානායක, 1960)

මෙම ඊශ්වර කවියා වාසය කළේ නිල්වලා ගඟේ ප්‍රධාන අතු ශාඛාව වන "කිරම ආර" සමීපයෙහි බවට මතයක් (දහනායක, 1960.10.13-14 ) පළ වුව ද අතැමෙක් (සිල්වා, 1960.12.20 ) පවසනුයේ මොහු නිල්වලා ගඟ අසබඩ නිවසක වාසය කළ බව යි. මෙම කවියාගේ ස්ථිර පදිංචිය පිළිබඳ විවිධ මතභේද ඇතත්, ඒ අතර බහුතර පිළිගැන්ම වී ඇත්තේ මොහු රංචාගොඩ ප්‍රදේශයේ වාසය කළ බව යි.

බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ දී නිල්වලා ගඟ හරහා ඉදිකළ මාතර යකඩ පාලම එකල ජනතාවට ආශ්චර්යක් වූ ආකාරය දක්වෙන ජනකවියක් හමුවේ.

දේස රටින් යකඩින් කණු ගෙන්නා ගඟ මැද වැල්ලේ සිටෙව්          සැටී
එක එක කණුවට සන්දි නවාලා යතුරු දඟෙන් කර කැවුණු          සැටී
දේස රටින් මහ සෙනඟ ඇවිදින් මාතර පාලම සැදූ          සැටී
යනෙනා මාතර තනනා පාලම හරියට මේ ලංකාව          වටී

(පතිරණ, 1987:101)

ඒදණ්ඩෙන් පාරුවෙන් එගොඩ මෙගොඩ වූ ජනතාවට යකඩ පාලම සැදීම විස්මයාවහ කටයුත්තක් විය. මෙම යකඩ පාලම පසු කරමින් සිටි ගැල්කරුවකුට සිදු වූ එක්තරා සිදුවීමක් ජනකවියට නැගී ඇත්තේ මෙසේ යඃ

මාතර යකඩ පාලම පසු කරන          විට
නාඹර ළඳක් ආවා මගේ පෙර          මඟට
ආදරයෙන් සිනාසුන මූත් සිත          ගන්ට
පාහර කෙල්ල ඔරවාගෙන ගියෙ          යන්ට

(බැද්දේගම, 2002:69)

**එක ජනකවියක් වටා ප්‍රවාද කිහිපයක් නිර්මාණය වීම**

මාතර ගඟේ ඉන්නා කිඹුලිගේ          පැටියා
තල්ල සුදයි බෙල්ලේ ගෝමර          කැටියා
යන එන ඔරු පාරු නවතා ගෙන          සිටියා
මිනී නොකයි මාතර කිඹුලිගෙ          පැටියා

(බණ්ඩාර, 2008.03.11)

මාතර නිල්වලා ගඟ ආශ්‍රිත සුප්‍රකට ම ජනශ්‍රැතිය වතුයේ උක්ත ජනකවිය යි. මෙම ජනකවියේ ජනප්‍රිය භාවය නිසා ම ඒ සඳහා විවිධ වූ අර්ථකථනයන් සහිත ප්‍රවාද රාශියක් බිහි වී තිබේ. ඒ අතර ප්‍රකට ම ප්‍රවාදය මෙසේ ය.

> "දැනට මාතර පල්ලිමුල්ල ලංගම ප්‍රධාන කාර්යාලයට යාබදව ඇති බිමේ පල්ලිමුල්ල තිලකරත්න වලව්ව මෑත කාලය වන තෙක් පැවති අතර මාතර රෝහණ මහා විද්‍යාලයෙහි ආරම්භය මෙම භූමියේ සිදුවිය. මෑත කාලය වන තෙක් මාතර තක්ෂිලා අධ්‍යාපන ආයතනය එම ස්ථානයේ පැවතිනි. පසුව මෙම ඉඩම මිලදීගත් පුද්ගලයකු මෙම තිලකරත්න වලව්ව පසුගිය වසරේ දී බිමට සමතලා කොට දමා ඇත.
>
> එකල මෙම තිලකරත්න වලව්වෙහි තිලකරත්න මුදලි නම් මුදලි කෙනෙකු වාසය කොට තිබේ. ඔහු තම වලව්ව ඉදිරිපිට නිල්වලා ගඟේ ගමන් ගන්නා ඔරු හා පාරුවලින් බදු මුදල් අයකර ගැනීමට චණ්ඩි මිනිසෙකු යොදවා සිටියේ ය. එම යුගයේ දැන් මෙන් ලොරි හා වාහන නොතිබූ බැවින් මාතර නගරයට හාල්, වී ඇතුළු ආහාර ද්‍රව්‍ය හා වැලි ගඩොල් ගෙන එන ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වූයේ පාරු හා ඔරු ප්‍රවාහන සේවය හා කරත්ත ප්‍රවාහන සේවය යි.
>
> තිලකරත්න වලව්ව සීමාවේ දී ඔරු හා පාරුවලින් ගමන් ගන්නා මිනිසුන් හිටගෙන යා යුතු ය. ඔවුන්ට වාඩි වී ගමන් ගැනීම තහනම් ය. වාඩි වී ගියහොත් බදු මුදල දෙගුණ වේ.
>
> මුදලි බලය තිබූ අවධිය හෙයින් එක ම ඔරුවෙන් දෙසරයක් බදු අය කිරීමට ද මෙම මුදලි විසින් යෙදවූ මිනිසා පසුබට නොවී ය. මාතර නගරයට යන අවස්ථාවේ දී හා ආපසු පැමිණෙන අවස්ථාවේ දී මෙසේ අසාධාරණ ලෙස ඔහු බදු අය කළේ ය. පාරුකරුවෝ මුදලි කෙරෙහි දැඩි අප්‍රසාදයෙන් පසු වූහ.
>
> මුදලි මිටි, මහත, කළු මිනිසකු විය. ඔහුගේ කටෙහි කිඹුලෙකු මෙන් සුදු කබර හැදී තිබූ අතර බෙල්ලෙහි අළුහම් නොහොත් ගෝමර බහුල ලෙස සැදී තිබුණි. පාරුකරුවන් මෙම තිලකරත්න මුදලිට ගොඩ කිඹුලා යැයි නමක් පට බැන්දාහ. මිනිසුන් ඔහුගේ වලව්වට 'ගොඩ කිඹුලාගේ වලව්ව' ලෙස හැඳින්වූ අතර මාතර ගඟේ ඉන්නා කිඹුලියගේ පැටියා ලෙසට මෙම මුදලි අනුවර්තනය කොට තිබුණි. 'යන එන ඔරු පාරු නවතා බදු අය කරනවා. මූ මිනී විතරක් කන්නේ නහැ. අනිත් සේරම දේවල් කරනවා'. පාරුකරුවන් කුරිරු ලෙස සූරා කෑ ඔරුබද්ද නිසා ඔහු තුළ කිඹුල් ගති මිසක් මිනිස් ගති නොමැති බැවින් කලකිරුණු පාරු කරුවකු වරක් මේ කවිය කිය "(ජනතා, 1999.11.10).

මෙම ප්‍රවාදයට සම්බන්ධ මුදලිගේ නම හා ඔහු පදිංචිව සිටි ස්ථානය පිළිබඳ ව විවිධ මති මතාන්තර මාතර ප්‍රදේශයේ ජනතාව අතර පවතී. එසේ ම මෙම බදු අයකළේ නාවිමන හුංගංගොඩ තොටුපළේ බවට ද මතයක් වේ.

මෙම ජනකවිය අරබයා මාතර ප්‍රදේශයේ ජනතාව අතර පවත්නා සෙසු ප්‍රවාදවලින් කිහිපයක් මෙසේ යඃ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 31-48
ISSN 1800-1459

"ඒ කාලේ ඔය මාතර මහ තොටුපලෙන් එගොඩ මෙගොඩ උනේ ඔරුවෙන්. මේ ඔරුව පැද්දේ ගෑනු කෙනෙක්. මේ ඔරුවෙන් එගොඩ මෙගොඩ වීම ජනතාවට අත්‍යාවශ්‍ය දෙයක් උනා. මේ අවශ්‍යතාවය නිසාම මේ ඔරුව පදින ගෑනි තමන්ට හිතුණ හිතුණ ගණන් මුදල් අය කරනවා. සාධාරණ මුදලක් අය නොකරන නිසා අනුකම්පා විරහිතව මුදල් අයකරන නිසා මේ ගෑනිට "කිඹුලි" කියල කිව්වා. මේ ගෑනි මැරුණයින් පස්සෙ ඇගේ දුව මේ ඔරුව පැද්දා. ඇගේ බෙල්ල රැලි වැටිලා ගෝමර වැටිලා. හොඳ ලස්සන කෙල්ලක්. "යන එන ඔරු පාරු නවතා ගෙන සිටියා" කියන්නෙ මෙහෙම අප්පොඩියක් ගහලා කතා කලාම යන එන ඔරුව උනත් ආපහු හරවගෙන ඇවිත් මගීන් එගොඩ මෙගොඩ කරලා බොහෝම සාධාරණ මුදලක් තමයි අය කෙරුවෙ(කුලතුංග, 2008.03.15).

"ඔය නාවිමන තොටුපළේ ඔරුවෙන් මිනිස්සු එගොඩ මෙගොඩ කොරල තියෙන්නේ ගෑනු අම්මණ්ඩි කෙනෙක්. මේ අම්මණ්ඩි අසාධාරණ විදියට තමයි සල්ලි අය කොරල තියෙන්නේ. අම්මගෙන් පස්සේ පුතා මේ ඔරුව පදින්න පටං ගත්තා. හැබැයි අම්ම වගේ නෙමෙයි පුතා සාධාරණ විදියට සල්ලි අය කොරාලු. ඒක තමයි ඔය කවියෙන් කියන්නේ''(විජයපාල, 2008.03.16).

"ඔය මාතර රෙදි හෝදන ගෑනු කෙනෙක් ඉදල තියෙනවා. ඔය ගෑනු කෙනාගේ පුතා හරිම නගරංකාරයා. මාතරට එන යන ඔරු පාරුවලිං මේ චණ්ඩියා කප්පං අය කරල තියනවා. මිනිස්සු බයටම මේ මිනිහට කප්පං දීල තියනවා. ඒක තමයි මිනී නොකයි මාතර කිඹුලිගෙ පැටියා. කියල කියන්නේ ''(උදේනිස්, 2008.02.01).

මෙම ප්‍රවාද නිර්මාණය වී ඇත්තේ ජනකවිය නිර්මාණය වීමෙන් පසු ව ය. එහෙයින් මෙම ප්‍රවාද ජනකවිය දෙස බලා පසු ව දුන් අර්ථකථන වීමේ සම්භාවිතාව ඉහළ ය. නො එසේනම් නිල්වලා ගඟ ආශ්‍රිත කප්පම් ගැනීමක් හෝ බදු අය කිරීම් හා මෙම ජනකවිය අතර කෘත්‍රිම සම්බන්ධතාවක් පසු ව ගොඩ නැගුණා විය හැකි ය. ජනශ්‍රැති ගණනාවක් එකතු වී පසු ව එක ජනශ්‍රැතියක් නිර්මාණය වීම කාලය හා අවකාශය අනුව සිදුවන්නකි. හර්බට් පතිරණ මෙම ජනකවිය අරබයා දක්වා ඇති අදහස මෙසේ ය.

"අන්දරේගේ කවි එකතුවක මේ ජනකවිය ඔහු වස් කවි කියන්නන් විහිළුවට ලක් කිරීමේ අටියෙන් ලියා ඇති බව සඳහන් වේ. මේ තුළින් කිසියම් ගුප්තාර්තයක් පළවන්නක් ලෙස සැලකීමට තරම් කිසිවකු පෙළඹෙනු ද පෙනී යයි. ගැඹුරු අරුතක් පළ කිරීම මාතර කවියන්ගේ සිරිත ය යන හැඟීම තරයේ ගත් හෙයින් එවැන්නක් සිදුවූ සේ සිතිය හැකි ය. කිඹුල් පැටියකු වුවත් සුරතල් සතකු ලෙස සලකා එයින් රසවින්දනයකට ජනකවියා මෙහි දී කැමැති විය. මාතර කිඹුලිගේ පැටියා යන්න පුනරුක්තියක් ලෙස යෙදීමෙන් ඌ කෙරෙහි අවධානය වඩාත් යොමුකර ඇත. ඌ සුලභ ව දක්නට නො ලැබෙන සුන්දර වස්තුවක් වන අයුරු දෙවන පෙළෙන් පැහැදිලි කරයි. තල්ලේ සුද,

ISSN 1800-1459

> බෙල්ලේ ගෝමරය, එයට තුඩු දෙන කරුණු, සුන්දරත්වය පිණිස වනදේ ලෙස ගෝමරවලට ජනකවියේ වෙසෙසි තැනක් ලැබී ඇත. දකුම්කළු කතුන්ට පමණක් නො ව ඇතුන්ට පවා ගෝමරය "අළු ගෝමර, පෙති ගෝමර මගුල් ඇතා" යි කීවේ එහෙයිනි. ගෝමර කැටියෙකු වන කිඹුල් පැටියා ජනකාන්ත දර්ශනයකි. ඔරු පාරුවෙන් යන එත්තෝ ගමන් නවතා ඌ දෙස බලා සිටින්නට අමතක නො කළහ. ඌ අහිංසකයකු බව මිනී නොකයි යන්නෙන් ධ්වනිත කර ඇත"(පතිරණ, 1990:23).

ජනශ්‍රැති සඳහා අර්ථකථන දීම අනවශ්‍ය වුවත් එම අර්ථකථන ම පසු කාලීන ව ජනශ්‍රැති බවට පත්වීමේ ජනශ්‍රැති ක්‍රියාවලිය උක්ත ප්‍රවාදයන්ගෙන් මැනවින් විශද වේ.

## නිගමනය

ලංකාවේ මුලින් ම ජනාවාස වූ උතුරු මැද ප්‍රදේශවලට වඩා පසු කාලීන ව නිරිත දිග ප්‍රදේශ ජනාවාස වූ හෙයින් මෙම ප්‍රදේශවලින් හමුවන බොහෝ ජනකවිවලට දීර්ඝ ඉතිහාසයක් නොමැති බැව් පෙනෙයි. විශේෂයෙන් ම නිල්වලා ගඟ ආශ්‍රිත ව බිහි වී ඇති ජනකවිවල ප්‍රස්තුතයන් විමසීමෙන් පෙනී යන්නේ එම බොහෝ ජනකවි මාතර යුගයේ දී ම නිර්මාණය වූ ඒවා බව යි. එසේ ම වයස අවුරුදු පනහට වැඩි වයස් ගත ජනතාව අතර පවත්නා ජනකවි වර්තමාන තරුණ පරපුරෙන් ගිලිහී ගොස් ඇති බව ද දත්ත එක් රැස්කිරීමේ දී අනාවරණය විය. ජනකවි යනු බොහෝ සෙයින් ම කාර්යානුබද්ධ ජනශ්‍රැති වෙසෙසකි. එම අදාල කාර්යයන් සමාජයෙන් තුරන් වීම හෙවත් වියැකී යාමත් සමග එම කාර්යයන් හා ආබද්ධ ජනකවි ද නිරායාසයෙන් ම අභාවිත ව යාම සිදුවෙයි. අතීතයේ දී ගඟ හා තදනුබද්ධ ව පැවති ජීවනව්‍යවහාරයන්ගේ අභාවයත් සමග නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි ද අභාවිත ව යාමේ තර්ජනයට දැඩි ලෙස මුහුණ දී ඇති බව නිගමනය කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය

තෙන්නකෝන්, ජයතිස්ස (2006) නිල්වලා ජන කතා, කොළඹ, එස්.ගොඩගේ සහ සහෝදරයෝ

පතිරණ, හර්බට් (1990) රුහුණු කවි, කොළඹ, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

_______________ (1987) සිංහල ජනකවි සංග්‍රහය, කොළඹ, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

_______________ (1990) 'මාතර ජන කවි හා ජන කාව්‍ය' මාතර කවිය විවේචනාත්මක විග්‍රහයක්. අමර හේවා මද්දුම, එස්. ජී. සමරසිංහ සහ තවත් අය (සංස්.), කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

පල්ලියගුරු, චන්ද්‍රසිරි (2005) ජනශ්‍රැතිය පුරාකතාව සහ පුරාවෘත්තය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

ප්‍රඥාලෝක, එච්. යූ (1952) *පුරාණ සිව්පද සංග්‍රහව*, කොළඹ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

බැද්දේගම, නන්දික (2002) *මාතර ජන කවි*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

රත්නායක, අබේසිල (1981) *අපේ සිංහල ජනකවි*, මොරටුව, සර්වෝදය මූලස්ථානය

රාය, හේමචන්ද්‍ර (1972) *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*. (සංස්.), කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය

වනරතන හිමි, කඹුරුපිටියේ (1994) *මාතර පුරාවිද්‍යාත්මක ඉතිහාසය*, තිහගොඩ, ශ්‍රී රෝහණ සංඝ සභා මූලස්ථානය

වීරසිංහ, අමරදාස (1986) *සිංහල ජනශ්‍රැතිය හැදෑරීම*, ගල්කිස්ස, සංස්කෘතික ප්‍රකාශන

වීරසූරිය, ජී. ඩී. එස් (1949) *දෙවුන්දර ඉතිහාසය*, දෙවුන්දර, ආර්. ජී. අර්නෝලිස් සිල්වා ප්‍රකාශයට පත්කරන ලදී.

_______________ (1993) *ජනකවි සාහිත්‍යය*, කොළඹ, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

සේනාරත්න, ජී. ඇම් (2006) *අප්‍රකට ජනකවි සංග්‍රහය*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

සෙනෙවිරත්න, නි. බ. මා (1964) *සිංහල කාව්‍ය සංග්‍රහය - මාතර යුගය*, කොළඹ, ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය

හේවාවසම්, ප. බ. ජී (1964) *මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන*, කොළඹ, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා සඟරාව, 1960. 03. 7, දිශානායක, ලිලියන් "*පැරණි කවි*" කොළඹ, ලංකාණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

දහනායක, සේපාල (1960) *'ඊශ්වරගේ කිවිවරයා'*, ශ්‍රී ලංකා සඟරාව, නොවැ. කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

සිල්වා, සචිරිස් (1960) *'ඊශ්වරගේ කිවිවරයා'*, ශ්‍රී ලංකා සඟරාව, නොවැ. කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

De Silva, Anslem., (2008) *The status of the saltwater crocodile (Crocodylus porosus) inhabiting the Nilwala River, Matara District and its impact on the community.* World Conservation Union.

## මානව දත්ත ග්‍රාහක නාමාවලිය

අන්දිරිස්, එගොඩ ගමගේ (92) 2008.02.05 "ලාවළු ගහ වතාව", රජගලගොඩ, කරගොඩ - උයන්ගොඩ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 31-48
ISSN 1800-1459

උදේනිස්, එච්. කේ. (81) 2008.02.01 "සුමිල", මාලිම්බඩ, පාලටුව.

කණ්ඩම්බි, පියසේන, (68), 2008.03.22 ''කුට්ටිය කඩේ'', කද්දූව, තෙලිජ්ජවිල.

කුලතුංග, ජයතිස්ස (63) 2008.03.15 'ප්‍රියංකර', වැවහමන්දූව, මාතර.

කොඩිතුවක්කු, රූපා (77) 2008. 01. 21 පරදූව, අකුරැස්ස.

ගමගේ, නිමල් ජේ. (94) 2008.02.25 ''චම්පිකා'', බණ්ඩත්තර, තිහගොඩ.

ජේම්ස්, විදානගමගේ (85) 2008.03.23 "මල්ලිකා නිවස", බෝපගොඩ, අකුරැස්ස.

පල්ලියගුරුගේ, චන්ද්‍රසිරි (64) 2008.01.11 සිංහල අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය, කැළණිය.

බණ්ඩාර, ඩබ්. එස්., වයස (71) 2008.03.11 ''පොල් ඉන්දුහේන'', කපුගම-බටහිර, දෙවිනුවර.

රිචඩ් ද සිල්වා, දී. වි (85) 2008. 12. 21 ''පින'', කුමාරතුංග මාවත, නූපේ, මාතර.

රේවත හිමි, වටගෙදර (61) 2008.02.27 සුධර්මාරාම පුරාණ පොත්ගුල් විහාරය, වටගෙදර, නාදුගල.

ලීලාරාම, ඩී. කේ. (80) 2008.02.23 ''ඉපිටවත්ත'', නාරංගල, කරගොඩ-උයන්ගොඩ.

වල්පොල, ජිනදාස (82) 2008.01.21 ''කොස්පැලවත්ත'', පරදූව, අකුරැස්ස.

විජයපාල, කේ. ජී (75) 2008.03.16 ''අඹගහ ගෙදර'', කද්දූව, කරගොඩ-උයන්ගොඩ.

විජයසෝම, තල්පාවිල (73) 2008.02.12 "සංඛජී" තල්පාවිල, කැකණදුර.

හරමානිස්, ඩී. එස්. (71) 2008. 02. 12 වෙළඳගොඩ, අතුරලිය බටහිර, අතුරලිය.

හෙන්ද්‍රික්, කේ. එම් (86) 2008.03.21 වත්තෙගෙ වත්ත, පරදූව, අකුරැස්ස